# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.18 පැය 0620 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1905/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>**

**01. සංජීව කුමාර සමරරත්න නොහොත් ගණේමුල්ල සංජීව නැමැත්තාගේ ඝාතනයට සම්බන්ධ ඉෂාරා සෙව්වන්දි නැමති සැකකාරියට සැඟව සිටීමට ආධාර අනුබල දුන් සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2025.02.19 වන දින අළුත්කඩේ අධිකරණ සංකීර්ණය තුළදී ඝාතනය වූ සංවිධානාත්මක අපරාධකරුවෙකු වූ සංජීව කුමාර සමරරත්න නොහොත් ගණේමුල්ල සංජීව නැමැත්තාගේ ඝාතනයට සම්බන්ධ ඉෂාරා සෙව්වන්දි නැමති සැකකාරියට සැඟව සිටීමට ආධාර අනුබල දුන් සැකකාරියක් 2025.10.16 වන දින හා සැකකරුවෙකු 2025.10.17 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් මගින් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 31 ක් වන අතර සැකකාරිය වයස අවුරුදු 52 ක් වන වැලිපැන්න ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. සැකකරු සැකකාරියගේ බෑණා වේ.**

කොළඹ අපරාධ කොට්ඨාසය මඟින් සැකකරු හා සැකකාරිය රැඳවුම් නියෝග මත රඳවාගෙන වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. ගජමුතු සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.10.17 වන දින උදෑසන කාලයේ මාලිගාවත්ත පොලිස් වසමේ බෝධිරාජාරාම පාර ප්‍රදේශයේදී කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ගජමුතුවක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 47 ක් වන මාලිගාවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ මධ්‍යම කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. හෙරොයින් සහ මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් මුදල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොළොන්නරුව පොලිස් ස්ථානය.

2025.10.17 වන දින දහවල් කාලයේ පොළොන්නරුව පොලිස් වසමේ මාඔය, බැදිවැව ප්‍රදේශයේදී පොළොන්නරුව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව මනම්පිටිය නිළ සුනඛ ඒකකයේ නිලධාරීන් සමඟ ඒකාබද්ධව සිදුකළ වැටලීමකදී **හෙරොයින් ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 300 ක් සහ මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ලද රුපියල් 30,24,900/= ක (තිස් ලක්ෂ විසි හතරදහස් නවසියක්) මුදලක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 28 ක් වන බැදිවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොළොන්නරුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද කහ සහ ආලේපන තොගයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මරදාන පොලිස් ස්ථානය.

2025.10.17 වන දින සවස් කාලයේ මරදාන පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද කහ කිලෝ 950 ක් සහ රූපලාවන්‍ය කටයුතු සඳහා යොදාගන්නා ආලේපන පෙට්ටි 2562 ක් සන්තකයේ තබාගෙන සිටි** පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 47 ක් වන කිරුළපන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරදාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - වෙන්නප්පුව පොලිස් වසම.

2025.10.17 වන දින උදෑසන කාලයේ වෙන්නප්පුව පොලිස් වසමේ වෙන්නප්පුව කිරිමැටියාන මාර්ගයේ ගොරකගස්හන්දිය ප්‍රදේශයේදී, වෙන්නප්පුව දෙසට ධාවනය වූ යතුරුපැදියක් අතුරු මාර්ගයක සිට ප්‍රධාන මාර්ගය ඔස්සේ කිරිමැටියාන දෙසට ධාවනය වූ වෑන් රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලබූ යතුරුපැදිකරු, පසුපැදිකාරිය හා වෑන් රථයේ රියදුරු මාරවිල රෝහලට ඇතුලත් කිරීමේදී යතුරුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 63 ක් වූ කොස්වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු ඥාතීන්ට භාර දී ඇත. වෙන්නප්පුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - කැබිතිගොල්ලෑව පොලිස් වසම.

2025.10.17 වන දින දහවල් කාලයේ කැබිතිගොල්ලෑව පොලිස් වසමේ කැබිතිගොල්ලෑව පදවිය මාර්ගයේ මහනැටියාව ප්‍රදේශයේදී පදවිය දෙස සිට කැබිතිගොල්ලෑව දෙසට ධාවනය වූ කැබ් රථයක් මාර්ගයේ වංගු සහිත ස්ථානයකදී රියදුරුට පාලනය කරගත නොහැකිව දකුණු මං තීරුව දෙසට ඇදී ගොස් ප්‍රතිවිරුද්ධ දෙසින් ධාවනය වූ කාර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ කාර්

රථයේ රියදුරු, එහි ගමන් ගත් පුද්ගලයින් දෙදෙනෙකු හා කැබ් රථයේ රියදුරු තුවාල ලබා කැබිතිගොල්ලෑව රෝහලට ඇතුලත් කිරීමේදී කාර් රථ රියදුරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 48 ක් වූ ඇටවීරගොල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කැබිතිගොල්ලෑව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර තුවාලකරුවන් වැඩිදුර ප්‍රතිකාර සඳහා වව්නියාව රෝහලට මාරු කර යවා ඇත. කැබිතිගොල්ලෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - මහියංගනය පොලිස් වසම.

2025.10.17 වන දින සවස් කාලයේ මහියංගනය පොලිස් වසමේ මහියංගනය ගිරාඳුරුකෝට්ටේ මාර්ගයේ තලංගමුව ප්‍රදේශයේදී මහියංගනය දෙසට ධාවනය වූ කාර් රථයක් මාර්ගය හරහා ගමන් කළ පදිකයකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා මහියංගනය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 85 ක් වූ දිවුලපැලැස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහියංගනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මහියංගනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - උඩවලව පොලිස් වසම.

2025.10.17 වන දින රාත්‍රී කාලයේ උඩවලව පොලිස් වසමේ රත්නපුර ඇඹිලිපිටිය මාර්ගයේ සිට කරමැටියආර දක්වා ඇති ගල්කොරිය අතුරු මාර්ගයේදී කරමැටියආර දෙසට ධාවනය වූ ටේලරය අමුණන ලද ට්‍රැක්ටර් රථයක ප්‍රතිවිරුද්ධ දෙසින් ධාවනය වූ යතුරුපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලබූ යතුරුපැදිකරු හා පසු පැදිකරුවන් දෙදෙනෙකු තුවාල ලබා ඇඹිලිපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී යතුරුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වූ කොළඹගෙආර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඇඹිලිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ට්‍රැක්ටර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. උඩවලව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**